# බළන්ගොඩ නගර සභාව - ටෙන්ඩර් දැන්වීම

**දොරවෙල රා තැබෑරුම ඉදිරිපිට අංක 03 දැන්වීම් පුවරුව, රත්නපුර පාර සරස්වතී පාර අසල අංක 09 දැන්වීම් පුවරුව හා බලන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියට යාබදව දැන්වීම් පුවරු 15 ක් ප්‍රදර්ශනය කිරීම සදහා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීම.**

බලන්ගොඩ නගර සභාවට අයත් පහත උප ලේඛනයේ සඳහන් ස්ථානයන්හි දිග අඩි 08 x උස 04 ප්‍රමාණයේ දැන්වීම් පුවරු 02 ක් හා බලන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය වටා දිග අඩි 07 x උස 2.5 දැන්වීම් පුවරු 15 ක් සවිකර ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් 2025 මැයි මස 27 වන දින සිට, 2025 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලය සඳහා බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් සමරවීර හෙන්ද්‍රිලාගේ අමිතා කරුණාරත්න වන මා විසින් 2025 මැයි මස 27 වන දින පෙ.ව.10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුළ දී නගර සභා කාර්යාලීය දුරකථන අංක 045-4930830 ඇමතීමෙන් හෝ info@balangoda.uc.gov.lk වෙතින් ලබා ගත හැකිය.

**ටෙන්ඩර්පත් නිකුත් කිරීම:**

2025 මැයි මස 26 වන දින ප.ව.3.00 දක්වා ටෙන්ඩර්පත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ.

**ටෙන්ඩර්පත් භාර ගැනීම:**

2025 මැයි මස 27 වන දින පෙ.ව.10.00 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් කාර්යාලයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ **ලේකම්, බළන්ගොඩ නගර සභාව** යන ලිපිනයට 2025 මැයි මස 27 වන දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ටෙන්ඩර්පත් විවෘත කිරීම:**

2025 මැයි මස 27 දින පෙ.ව.10.30 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගී විය හැකිය.

**උපලේඛනය**

| අනු අංකය | ටෙන්ඩර් කැඳවනු ලබන දැන්වීම් පුවරුවේ නම හා අංකය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල | අයදුම්පත් ගාස්තුව | අවම මාසික ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|
| 1 | දොරවෙල රා තැබෑරුම ඉදිරිපිට දිග අඩි 08 x උස 04 ප්‍රමාණයේ දැන්වීම් පුවරුව - අංක 03 | රු.2,000.00 | රු.1,000.00 | රු.4,000.00 |
| 2 | රත්නපුර පාර සරස්වතී පාර අසල දිග අඩි 08 x උස 04 ප්‍රමාණයේ දැන්වීම් පුවරුව - අංක 09 | රු. 2,000.00 | | රු. 2,000.00 |
| 03 | බලන්ගොඩ ක්‍රීඩාපිටියට යාබදව දිග අඩි 07 x උස 2.5 ප්‍රමාණයේ දැන්වීම් පුවරු 15 ක් සවිකිරීම.(G-01 සිට G -15 දක්වා) | රු. 2,000.00 (එක් දැන්වීම් පුවරුවක් සඳහා පමණි) | | රු.3,350.00 (එක් දැන්වීම් පුවරුවක් සඳහා පමණි) |

**විශේෂ කොන්දේසි:**

- ඉදිරිපත් කරන ටෙන්ඩරයේ මුදල හා ඉහත උප ලේඛනයේ සඳහන් ගාස්තු සඳහා රජය විසින් පනවනු ලබන බදු මුදල්ද ගෙවිය යුතුය.
- දැන්වීම් පුවරුවේ නම හා අංකය සඳහන්කර ලංසුකරුවන්ගේ කැමත්ත අනුව දැන්වීම් පුවරු එකකට හෝ සියල්ලටම හෝ ලංසු ඉදිරිපත්කල හැකිය. එසේ ඉදිරිපත් කිරීමේදී දැන්වීම් පුවරු අංක සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර අදාළ ගාස්තු ගෙවා අයදුම්පත්‍ර ලබාගත යුතුය.
- දැන්වීම් පුවරු එකකට වැඩි ප්‍රමාණයකට ලංසු ඉදිරිපත්කරන ලංසුකරුවන්, ලංසු ඉදිරිපත්කරන දැන්වීම් පුවරු වෙනුවෙන් නියමිත අදාළ ටෙන්ඩර් ඇප තැන්පත් මුදල ගෙවිය යුතුය.
- තෝරා ගන්නා ලද බදු කරුවන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බළන්ගොඩ නගර සභාවට ගෙවිය හැකිය. එම මුදලින් තුනෙන් එකක් නොහොත් මසක කුලිය බදුකරු තෝරා ගෙන පළමු පැය තුළ ගෙවිය යුතුය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි කොටස් දෙක නොහොත් මාස දෙකක කුළිය දැන්වීම් පුවරු බදුගත් අය විසින් 2025.05.27 දින අවසාන වන විට එකවර ගෙවා ගිවිසුම් අත්සන් කළ යුතුය.
- තෝරා ගන්නා ලද බදු කරුවන් ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු දැන්වීම් පුවරු බලන්ගොඩ නගර සභාවේ කාර්මික නිලධාරී මහතාගේ තාක්ෂණික උපදෙස් අනුව යෝග්‍ය සනකම සහිත බොක්ස් බාර් යොදාගනිමින් සකස්කරගතයුතුය.
- ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බළන්ගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුය.
- ටෙන්ඩර් කොන්දේසි සහ විස්තර ටෙන්ඩර් අයදුම්පත්‍රය සමග ලබා දෙනු ලැබේ.

2025 මැයි මස 09 වන දින,
බළන්ගොඩ නගර සභාවේදීය.

එස්.එච්.ඒ. කරුණාරත්න,
ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
බළන්ගොඩ නගර සභාව.